
පළමුවෙනි සභාපතිත්වයේ පණිවුඩය, අප්‍රේල් 2017



***සභාපති ඩීටර් එෆ්. උක්ඩෝෆ් විසිනි***

***පළමුවෙනි සභාපතිත්වයේ දෙවන උපදේශකවරයා***

# ආචාර්‍යවරයා සහ සබන් සාදන්නා

දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකළ සබන් සාදන්නෙක් ගැන පැරණි යුදෙව් කථාවක් ඇත. එක් දිනක් ඔහු ආචාර්‍යවරයෙක් සමග ගමන්කරන විට, ඔහු මෙසේ කීවේය, "මට අවබෝධ නොවන යම් දෙයක් ඇත. අපට වසර දහස් ගණනක සිට ආගමක් ඇත. නමුත් ඔබ බලන සෑම තැනකම ඇත්තේ නපුර, දූෂණය, වංකකම, අසාධාරණය, වේදනාව, කුසගින්න, සහ සැහැසිකමයි. ආගමෙන් ලෝකය කිසිසේත්ම දියුණුවී නැති බව පෙනේ. එනිසා මම ඔබෙන් අසන්නේ, එයින් ඇති යහපත කුමක්ද? "

ආචාර්‍යවරයා මඳ වේලාවක් පිළිතුරක් දුන්නේ නැති නමුත්, සබන් සාදන්නා සමග දිගටම ඇවිද ගියේය. අවසානයේදී ඔවුන් ක්‍රීඩාපිටියකට ලගාවූ අතර, එහි ළමෝ දුහුවිල්ලෙන් නැහැවී, අපිරිසිදුව ක්‍රීඩාකරමින් සිටියහ.

"මට නොතේරෙන යම් දෙයක් ඇත," ආචාර්‍ය-වරයා කීවේය. "අර ළමුන් දෙස බලන්න. වසර දහස්ගණනක සිට අපට සබන් ඇත. එහෙත් අර ළමයි අපිරිසිදුය. සබන්වලින් ඇති යහපත කුමක්ද?

සබන් සාදන්නා පිළිතුරු දෙමින්, "නමුත් ආචාර්‍යතුමනි, මේ අපිරිසිදු ළමයින් නිසා සබන්වලට දොස් පවරන්න එපා. සබන් පාවිච්චිකළ යුත්තේ, එයට එහි අරමුණ ඉටුකරගැනීමට පෙරය."

ආචාර්‍යවරයා සිනාසී මෙසේ කීවේය, "හරියට හරි."

අප ජීවත්විය යුත්තේ කෙසේද?

පාවුල් ප්‍රේරිතවරයා, පරණ ගිවිසුමේ අනාගතවක්තෘවරයෙක් උපුටා දක්වා, ඇදහිලිවන්තයා විශ්වාසවන්තයා කවරෙක්දැයි සාරාංශකර මෙසේ ලීවේය, "ධර්මිෂ්ටයා ඇදහිල්ලෙන් ජීවත්වෙයි" (රෝම 1:17).

සමහරවිට මෙම සරළ ප්‍රකාශය තුලින් දුර්වල සහ නිෂ්ඵල ආගමක් සහ ජීවිත වෙනස්කළ හැකි බලයක් තිබෙන ආගමක් අතර වෙනස අපට අවබෝධවේ.

නමුත් ඇදහිල්ලෙන් ජීවත්වීම යන්නෙහි අදහස තේරුම්ගැනීම සඳහා ඇදහිල්ල යනු කුමක්දැයි අප තේරුම්ගත යුතුය.

ඇදහිල්ල යනු විශ්වාසයට වඩා වැඩි දෙයකි. එය ක්‍රියාව හා සම්බන්ධිත දෙවියන්වහන්සේ කෙරෙහි ඇති සම්පූර්ණ විශ්වාසයයි.

එය ප්‍රාර්ථනයකට වඩා වැඩි දෙයකි.

එය හුදෙක් වාඩිවී සිටිමින්, අපගේ හිස් සොලවමින්, අප එකඟයි කියා කියනවාට වඩා වැඩි දෙයකි. "ධර්මිෂ්ටයා *ඇදහිල්ලෙන් ජීවත්වේ* " යයි අප කියනවිට, අප අදහස්කරන්නේ අපට මගපෙන්වමින්, මෙහෙයවන්නේ අපගේ ඇදහිල්ල බවය. අපගේ ඇද-හිල්ලට අනුකූල ආකාරයෙන් අපි *ක්‍රියාකරන්නෙමු.* — සිතිවිල්ලෙන් තොර කීකරු හැඟීමකින් නොව, නමුත් අපගේ දෙවියන්වහන්සේට විශ්වාසයෙන් සහ අවංක ප්‍රේමයෙන් යුතුව උන්වහන්සේ තමන් දරුවන්ට එළිදරව් කළ අමිල ප්‍රඥාව වෙනුවෙන්ය.

ඇදහිල්ල ක්‍රියාව සමග අනුබද්ධ විය යුතුය; එසේ නොමැතිවිට එය මැරිලාය (බලන්න යාකොබ් 2:17). එය සැබෑ ඇදහිල්ල නොවේ. එක් පුද්ගලයෙක් හෝ ලෝකයා හෝ වෙනස්කිරීමට බලයක් එහි නැත.

ඇදහිලිමත් මිනිස්සු සහ ස්ත්‍රීහු ඔවුන්ගේ දයාවන්ත ස්වර්ගික පියාණන්වහන්සේ විශ්වාසකරති— අස්ථිර කාලවල් තුලදී, හොඳින් දැකීමට හෝ පැහැදිළිව තේරුම්ගැනීමට නොහැකි සැකමුසු සහ විපත් කාලතුලදීද එසේය.

ඇදහිලිමත් මිනිස්සු සහ ස්ත්‍රීහු, ගෝලකමේ මාවතේ උනන්දුවෙන් ඇවිද, ඔවුන්ගේ ආදරණීය ගැලවුම්කරුවාණන් වන, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය අනුගමනයකිරීමට පරිශ්‍රම දරති. ඇදහිල්ල ඇත්තවශයෙන්ම අපගේ සිත් ස්වර්ගය දෙසට නැමීමට සලස්වා, ක්‍රියාකාරීව ලඟාකර, ඔසවාතබා, අපගේ සහෝදර ජනතාවට ආශිර්වාදකිරීමට පොළ-ඹවයි.

ක්‍රියා නොමැති ආගම, පෙට්ටියක් තුල තිබෙන සබන්වලට සමානය. එයට පුදුමාකාර හැකියාවක්

තිබිය හැකි නමුත්, ඇත්තවශයෙන්ම, එයින් අද-හස්කරන අරමුණ ඉෂ්ටවන තුරු, වෙනසක්කිරීමට එහි ඇත්තේ කුඩා බලයකි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පිහිටුවන ලද ශුභාරංචිය, ක්‍රියාකාරී ශුභාරංචියකි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව සැබෑ ආගම උගන්වයි, එය බලාපොරොත්තුවේ, ඇද-හිල්ලේ, දයාවේ පණිවුඩයකි, ආත්මික සහ ලෞකික අන්දමින් අන් අයට උපකාරකිරීමද ඊට ඇතුළත්ය.

මාස කිහිපයකට පෙර, මාගේ බිරිඳ හැරියට් සහ මම, අපගේ ළමයින් කිහිපදෙනෙක් සමග පවුලේ සංචාරයක් ලෙස මධ්‍යධරණී ප්‍රදේශයට ගියෙමු. අපි අනාථ කඳවුරු කිහිපයකට ගොස් යුද්ධයෙන් විනාශවූ රටවල පවුල් හමුවුනෙමු. මෙම ජනතාව අපගේ ආගමේ අය නොවේ. නමුත් අපේ සහෝදර සහොදරියන්වූ ඔවුන්ට හදිසි උපකාර අවශ්‍යව තිබින. අපගේ සිත් තදින්ම ස්පර්ශශීලීවුනේ, අපගේ සභා සාමාජිකයන් ක්‍රියාකාරී ඇදහිල්ලෙන් යුතුව ඔවුන්ගේ ආගම, ජාතිය, හෝ අධ්‍යාපනය නොසළකමින්, අපගේ සහෝදර ජනතාවට අවශ්‍ය උපකාරය, සහනය සහ බලාපාරොත්තුවක් ලබාදීම නිසාය.

නිරන්තර ක්‍රියා සමග එක්ව තිබෙන ඇදහිල්ල, සිත කරුණාවෙන්ද, මනස ප්‍රඥාවෙන් සහ අවබෝධයෙන්ද, ආත්මය සමාදානය සහ ප්‍රේමයෙන්ද පුරවාලයි.

අපගේ ඇදහිල්ල අප වටා සිටින අයට සහ අපටද, ආශිර්වාද කර, ධර්මිෂ්ට බලපෑමක් සමග ආශිර්වාද කළ හැකිය.

අපගේ ඇදහිල්ලට ලෝකයා යහපතින් සහ සමාදානයෙන් පිරවිය හැකිය.

අපගේ ඇදහිල්ල ද්වේශය ප්‍රේමයටද, සතුරන් මිතුරන් ලෙසද, වෙනස්කළ හැකිය.

ධර්මිෂ්ට අය එවිට, ඇදහිල්ලෙන් ක්‍රියාකර ජීවත්වෙති. ඔවුහු දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසකරමින් ජීවත්වී, උන්වහන්සේගේ මාර්ගයේ ගමන්කරනු ඇත.

පුද්ගලයන්, පවුල් සහ ජාතීන් සහ ලෝකයාද වෙනස්කළ හැක්කේ ඒ අන්දමේ ඇදහිල්ලකිනි.

---

## මේ පණිවුඩයෙන් ඉගැන්වීම

එම ඇදහිල්ල විශ්වාසය ප්‍රකාශකිරීමට වැඩි දෙයක් බව සභාපති උක්ඩෝෆ් පැහැදිලිකරයි. ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි සැබෑ ඇදහිල්ලට, ක්‍රියාව අවශ්‍යවන අතර, ඇදහිල්ලෙන් ජීවත්වීමෙන් ජීවිත සහ නිවාස වෙනස්කිරීමට බලයද ඇත. ඔබ උගන්වන අයට ආරාධනාකර, ඇදහිල්ල අනුව ජීවත්වීමෙන් ලැබෙන ආශිර්වාද සහ බලය ගැන ඔවුන් දැක තිබෙන අවස්ථා බෙදාගැනීමට කියන්න—ඒවා පුද්ගලික උදාහරණ හෝ අන් අයගේ නිරීක්ෂණ විය හැකිය.

# තරුණ අය

## අන් අයට ඇදහිල්ලෙන් සේවයකිරීම

දෙවියන්වහන්සේ කෙරෙහි අපගේ ඇදහිල්ල, "ක්‍රියා මගින් අනුබද්ධවිය" *යුතු* බව සභාපති උක්ඩෝෆ් අපට කියයි. අපගේ ඇදහිල්ල "ක්‍රියා මගින් නිරන්තරව අනුබද්ධවූ විට" එය "සමාදානයෙන් සහ ප්‍රේමයෙන් ආත්මය ...පුරවන බව" ඔහු පැහැදිළිකරයි. මෙම ආශිර්වාදයේ පොරොන්දුව සමග, අපට වෙනසක් කළ *හැකිය.* එසේම අපට ඇදහිල්ල-පිරුණු සේවයක් කළ හැකි නම්, අපගේ ජීවිත තුල මෙය අපට දැකිය හැක. හැම උදෑසනකම යාච්ඥාකර, අන් අයට සේවයකිරීමට ස්වාමීන්වහන්සේගෙන් උපකාර ඉල්ලීමට ඔබට පුළුවන. උදාහරණයක් ලෙස, සහෝදරයෙකුට යම් ක්‍රියාවකදී උපකාර අවශ්‍යවූ විටකදී හෝ මිතුරෙකුට ප්‍රශංසාවක් අවශ්‍ය විටකදී, එය පෙන්වන ලෙස උන්ව-හන්සේගෙන් ඉල්ලාසිටීමට ඔබට පුළුවන. ඉන්පසුව ඔබට පෙළඹවීමක් ලැබුන විට, ඒ අනුව කටයුතු කරන්න! මෙම යාච්ඤා සහ මෙම සේවය ඔබ පුරුද්දක් ලෙස කළ හොත්, එවිට ඔබගේ ඇදහිලිමත්, නිරන්තර ක්‍රියාව ඔබගේ ජීවිතය සහ අන් අයගේ ජීවිතද ආශිර්වාදකරනු ඇත. සභාපති උක්ඩෝෆ් පොරොන්දුවන්නේ, ඔබට "පුද්ගලයන්, පවුල්, ජාතීන් සහ ලෝකයාද වෙනස්කළ හැකි බවය"

# ළමයි

## විශ්වාසය

මෙම ක්‍රියාකාරකම කිරීමට මිතුරෙක් සමග උත්සාහකරන්න. ඔවුන්ගේ උපදෙස් විශ්වාසයෙන් සහ ප්‍රවේශමෙන් අනුගමනයකරන්න.

හිස් කොල කැල්ලක් ගෙන, මුහුණක් නියෝජනය වන රවුමක් එහි අඳින්න. පෑනක් හෝ පැන්සලයක් අතට ගෙන, ඔබගේ ඇස් වසාගන්න. එම මුහුණේ ඇස්, නාසය, මුඛය සහ කොණ්ඩය අඳින තැන් ඔබට කියන ලෙස ඔබගේ මිතුරෙකුට කියන්න. ඉන්පසුව එය බලන්න. ඔබගේ පින්තූරය නිසියාකාර තිබේද? එම මුහුණ පාට කර, ක්‍රීඩාව නැවතත් කිරීමට තවත් රවුමක් අඳින්න.

සමහර අවස්ථාවලදී උපදෙස් පිළිපැදීම අසීරුය. නමුත් අපි ශුද්ධාත්මයාණන්වහන්සේට සවන්දෙමින්, ස්වර්ගික පියාණන් අනුගමනයකිරීමට උත්සාහකරන විට, උන්වහන්සේ අපට උදව්කරනසේක. නිතරම උන්ව-හන්සේව විශ්වාසකිරීමට අපට පුළුවන.

© 2017 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ඇඑජ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/16. පරිවර්තන අනුමැතිය 6/16.
2017 April First Presidency message පරිවර්තනයයි Sinhala -97924-408

බැහැදැක ඉගැන්වීමේ පණිවුඩය, අප්‍රේල් 2017

# පූජකවරයේ පොරොන්දු සහ ගිවිසුම්

මෙම ලිපිය ප්‍රවේශමෙන් අධ්‍යයනයකර, බෙදාගන්නේ මොනවාදැයි දැනගැනීමට ආනුභාවය සොයන්න. සහන සමිතියේ අරමුණ ගැන අවබෝධකර ගැනීමෙන්, දෙවියන්වහන්සේගේ දියණියන් සදාකාලික ජීවනයේ ආශිර්වාද සඳහා සූදානම් කෙරන්නේ කෙසේද?

ඇදහිල්ල පවුල සහ සහනය

පූජකවරයේ පොරොන්දු සහ ගිවිසුම්, සොහොයුරියන් වන අපට පුද්ගලිකව අදාළවන අන්දම ගැන අපට වඩාත් අවබෝධවන තරමටම, අපි පූජකවරයේ ආශිර්වාද සහ පොරොන්දු වඩා වඩාත් වැළඳගන්නෙමු.

ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි එම්. රසල් බැලාර්ඩ් මෙසේ කීවේය, “ස්වාමීන්වහන්සේ සමග පූජනීය ගිවිසුම් තැබූ සියල්ලෝ සහ මෙම ගිවිසුම්වලට ගරුකරන්නෝද, පුද්ගලික එළිදරව් ලැබීමට, දේවදූතයන් විසින් මෙහෙකරනු ලැබීමට ආශිර්වාදිතවීමට, දෙවියන්වහන්සේ සමග කථාකිරීමට, ශුභාරංචියේ පූර්ණත්වය ලැබීමටත්, අවසානයේදී, අපගේ පියාණන්වහන්සේ සතු සියල්ලට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පාර්ශවයේ උරුමක්කාරයන්ද වන්නෙමු.”[1]

පූජකවරයේ පොරොන්දු සහ ගිවිසුම්වල ආශිර්වාද සහ පොරොන්දු, පුරුෂ සහ කාන්තා දෙපක්ෂයටම අදාළවේ. ෂෙරී. එල්. ඩිව් සොයුරිය, සහන සමිතියේ ප්‍රධාන සභාපතිත්වයේ හිටපු උපදේශිකාව මෙසේ කීවාය, “ස්වාමීන්වහන්ස්ගේ ගෘහයේ උසස්ම නියෝග ඇතුලත් පූජකවරයේ පූර්ණත්වය ලබාගත හැක්කේ පුරුෂයා සහ ස්ත්‍රිය යන දෙදෙනාටම පමණි.”[2]

ලින්ඩා කේ. බර්ටන් සොහොයුරිය, සහන සමිතියේ ප්‍රධාන සභාපතිනිය මෙම කැඳවීම නිකුත්කර ඇත, “පූජකවරයේ පොරොන්දු සහ ගිවිසුම් කටපාඩම් කිරීමට මම ඔබට ආරාධනාකරමි, එය දහම සහ ගිවිසුමේ 84:33—34 පදවල සඳහන්ය. එසේ කිරීමෙන් පූජකවරය ගැන ඔබගේ අවබෝධය ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් පුළුල්කර, අසිරිමත් අන්දමින් ඔබ ආනුභාමත්කර, ඔසවාතබනු ඇත.”[3]

ජෝසෆ් ස්මිත් සහන සමිතියට දුන් උපදෙස්වලින් අදහස්කරන ලද්දේ, කාන්තාවන් ”පූජකවරයේ වරප්‍රසාද සහ ආශිර්වාද මෙන්ම දීමනාද අයත්කරගැනීමට” සූදානම්කිරීමය. දේවමාළිගා නියෝග තුලින් මෙය ඉටුකරගත හැකිය.

“දේවමාළිගා නියෝග [නම්] පූජකවරයේ නියෝගයි. නමුත් ඒවා පුරුෂයන් සහ ස්ත්‍රීන් මත විනයානුගත (ඉක්ලැස්ටිකල්) නිලයක් මත දානයකරනු [නො]ලැබේ. [මෙම නියෝග ඉටුකරන්නේ] ස්වාමීන්වහන්සේගේ පොරොන්දුවයි, එනම් උන්වහන්සේගේ ජනතාව—ස්ත්‍රීන් සහ පුරුෂයන්—‘ඉහළින් ලැබෙන බලයෙන් එන්ඩව්කරනු ලබන්නේය’ [ඩීසහසී 38:32].”[4]

## අමතර ශුද්ධ ලියවිලි සහ තොරතුරු

දහම සහ ගිවිසුම 84:19–40; 121: 45–46; reliefsociety.lds.org

### සටහන්

1. එම්. රසල් බලාඩ්, “Men and Women and Priesthood Power,” *Liahona,* සැප්. 2014, 36.
2. ෂෙරී එල්. ඩිව්, *Daughters in My Kingdom: The History and Work of Relief Society* තුලිනි (2011), 128.
3. ලින්ඩා කේ. බර්ටන්, “Priesthood Power—Available to All,” *Ensign,* ජූනි 2014, 39–40.
4. Gospel Topics, “Joseph Smith’s Teachings about Priesthood, Temple, and Women,” topics.lds.org.
5. Gospel Topics, “Joseph Smith’s Teachings about Priesthood, Temple, and Women,” topics.lds.org.

### මේ ගැන සළකාබලන්න

පූජකවරයේ පොරොන්දු සහ ගිවිසුම්වල පොරොන්දු ආශිර්වාද සම්පූර්ණයෙන්ම අවබෝධකරගෙන ප්‍රවේශවීම සඳහා ඔබට කළ හැකි දේවල් මොනවාද?

© 2017 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ඇළුජ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතියඃ 6/16. පරිවර්තන අනුමැතිය 6/16.
2017 April Visiting Teaching message පරිවර්තනයයි Sinhala -97924-408